# කැලණිය විශ්වවිද්‍යාලය-ශ්‍රී ලංකාව

## විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය

### වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය

ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍ය) උපාධි

ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2008

**BMGT E 1045/ BMGT 13045 – ව්‍යාපාර නීතිය**

ප්‍රශ්න සංඛ්‍යාව : 08

කාලය : පැය 03 යි

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

(01) (අ) පහත දැක්වෙන "අර්පණයන්" වලංගු ඒවාදැයි සඳහන් කරන්න. ඔබගේ පිළිතුර හේතු සහිතව පැහැදිලි කරන්න.

(i) නිමි ඇඳුම් අලෙවිකරන ආයතනයක් පහත සඳහන් දැන්වීම පුවත්පතක පල කරනු ලැබිය. "ළමුන්ගේ නිමි ඇඳුම්වල මිල රු. 250/= සිට රු. 100/= දක්වා අඩු කලා. මෙය හෙට දිනයේදී පමණක් ලබාදෙන විශේෂ මිල අඩු කිරීමකි."

(ii) "තෙල් ටොන් සියයක්" රනුරගෙන් මිලදී ගැනීම සඳහා අනුර යෝජනාවක් ඉදිරිපත් කරයි.

(iii) "මම ඔබට කැමරාවක් විකිණීමට කැමැත්තෙමි." යනුවෙන් කුමාරි, නෙලුම්ට පවසයි. කුමාරි විවිධ වටිනාකම් ඇති කැමරා 03 ක හිමිකාරියකි.

(iv) සමන් වෙන්දේසිකරුවෙකු වූ අතර ඔහුගේ සාප්පුවේ වෙන්දේසියට තබා තිබූ භාණ්ඩ අතර ශීතකරණයක්ද විය.

(v) සිය නැතිවූ බල්ලා සොයා ගෙනවිත් භාර දෙන ඕනෑම කෙනෙකුට රු. 5000/= ක ත්‍යාගයක් පිරිනමන බවට දීපාල් "සන්ඩේ ටයිම්ස්" පුවත්පතෙහි දැන්වීමක් පළ කරයි.

(ලකුණු 10)

(ආ) විනිශ්චිත නඩු තීන්දුවක් වන කාලයිල් ඒ. කාබොලික් ස්මොක් බොල් සමාගම (1893) CA හි සඳහන් ගිවිසුම් නීතියට අදාල මූලධර්ම තුනක් නම් කරන්න.

(ලකුණු 03)

(ඇ) ශ්‍රී ලංකාවේ පදිංචි අමල්. එංගලන්තයේ සිටි ඩේවිඩ් වෙත තේ තොගයක් විකිණීම පිණිස අර්පණයක් ෆැක්ස් පණිවිඩයක් ලෙස ඉදිරිපත් කරන ලදී. එම අර්පණය ඩේවිඩ් විසින්ද ෆැක්ස් පණිවිඩයක් යවා ප්‍රතිග්‍රහණය කරන ලදී. නමුත් අවාසනාවකට, අමල්ට පොරොන්දු වූ පරිදි තේ තොගය, ඩේවිඩ් වෙත යැවීමට නොහැකි විය. දැන් ඩේවිඩ්, අමල්ට එරෙහිව නීතිමය පියවර ගැනීමට අදහස් කරයි. නීතිමය පියවර ගැනීම පිණිස අදාල ගිවිසුම කුමන රටකදී ස්ථාපිත වූයේදැයි දැන ගැනීමට අධිකරණයට අවශ්‍යව තිබේ.

ඔබ විසින් විනිශ්චිත නඩු තීන්දු ද යොදාගනිමින්, එම ගිවිසුම කුමන රටේදී ස්ථාපිත වූයේදැයි දක්වන්න.

(ලකුණු 07)

(02) (අ) නිමල්, පැටවුන් බෝ කිරීමේ පරමාර්ථය උදෙසා අශ්වයෙකු මිල දී ගැනීමට අදහස් කළේය. ඔහු, ජෝන්ගේ ඉස්තාලය වෙත ගිය අතර, ඔහු ෂයිනි නම් අශ්වයා පරීක්ෂා කරන විට ජෝන් පැවසුවේ, ඔබ අශ්වයා පිළිබඳව සොයා බැලිය යුතු නැති බවත්, ඌ ඉතාමත් නිරෝගී බවත්, අශ්වයා සම්බන්ධ යම්

ප්‍රශ්නයක් තිබේ නම් තමා ඒ බැව් නිමල් වෙත පවසන බවත්ය. තවදුරටත් අශ්වයාව පරීක්ෂා නොකොට, නිමල් අශ්වයා මිලදී ගත්තේය. නමුත් අශ්වයා වෙත තිබූ පාරම්පරික ඇස් රෝගයක් හේතුවෙන් ඌ පැටවුන් බෝ කිරීමේ පරමාර්ථයට නුසුදුසු විය.

නිමල් වෙත ඇති නෛතික ප්‍රතිකර්ම මොනවාදැයි විස්තර කරන්න.

(ලකුණු 08)

(ආ) වන්දි ගෙවීම පිළිබඳව අදාල වන්නාවූ රීති මොනවාදැයි පැහැදිලි කරන්න. ඔබගේ පිළිතුර සඳහා විනිශ්චිත නඩු තීන්දු යොදාගන්න.

(ලකුණු 12)

(03) (අ) "කොන්දේසියක්" සහ "ප්‍රතිඥාභාරයක්" අතර ඇති වෙනස්කම් මොනවාද?

(ලකුණු 04)

(ආ) කුරුළු කෑම වෙළෙන්දෙකු වන ජෝන්ගෙන් චාලි කුරුළු කෑම තොගයක් මිලදී ගනියි. එම කෑම කුරුල්ලන්ට චාලි විසින් ආහාර පිණිස දුන් අතර, ආහාර ගැනීමෙන් පසුව සියළුම කුරුළු පැටවුන් මිය යන ලදී. නමුත් එම කෑම ලොකු කුරුල්ලන්ට සහ වෙනත් සතුන්ට සුදුසු බැව් පසුව අනාවරණය විය. අදාල කුරුළු කෑම ගැණුම්කරුගේ පරමාර්ථයට සුදුසු නොවීය යන්න සහ එහි වෙළඳ තත්ත්වයක් නොමැත යන පදනම මත ජෝන්ට එරෙහිව නඩු පැවරීමට දැන් චාලිට අවශ්‍යව ඇත. චාලිට උපදෙස් දෙන්න.

(ලකුණු 08)

(ඇ) පහත අවස්ථාවන්හිදී භාණ්ඩ වල අයිතිය මාරුවීටම අදාල වන නීතිමය විධිවිධාන මොනවාද?

(i) නිශ්චිතව හඳුනා නොගත් භාණ්ඩ විකිණීම.

(ii) අනුමැතිය හෝ විකිණීම හෝ ආපසු එවීමේ පදනම මත භාණ්ඩ විකිණීම.

(ලකුණු 08)

(04) (අ) නියෝජිතයෙකු විසින් තෙවන පාර්ශ්වයක් සමඟ ඇති කර ගත් පහත සඳහන් ගිවිසුම් වල බලපෑම කුමක්දැයි විස්තර කරන්න.

(i) ප්‍රධානියාගේ නම හෙළි කරමින්,

(ii) ප්‍රධානියාගේ පැවැත්ම හෙළි කරමින්

(iii) ප්‍රධානියාගේ පැවැත්ම හෙළි නොකරමින්

(ලකුණු 12)

(ආ) විනිශ්චිත නඩු කෙරෙහි අවධානය යොමු කරමින් ප්‍රධානියෙකු කෙරෙහි නියෝජිතයෙකු වෙත පවත්නා යුතුකම් මොනවාදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 08)

(05) (අ) රේඛීය චෙක්පත්, "ආදායකයාගේ ගිණුමට පමණක්" සහ "ගණුදෙනු කළ නොහැක" යනුයෙන් රේඛනය කිරීමේ අදහස සහ බලපෑම කුමක්ද?

(ලකුණු 04)

(ආ) විනිමය බිල්පත් ආඥා පනතට අනුව, දරන්නා, අගයකට දරන්නා සහ යථා කාල ධාරකයා යනු කවරෙක්ද?

(ලකුණු 09)

(ඇ) අනිල්, බර්නාඩ් වෙතින් භාණ්ඩ තොගයක් ඇණවුම් කළ අතර, ඒ සඳහා අත්තිකාරම් මුදලක් වශයෙන් "ගණුදෙනු කළ නොහැක" යනුයෙන් රේඛනය කළ රු. 10,000/= වටිනා චෙක්පතක් ලබා දෙන ලදී. නමුත් බර්නාඩ්ට අදාල භාණ්ඩ සැපයීමට නොහැකි විය. එබැවින් අනිල් චෙක්පත උදෙසා ගෙවීම් නතර කලේය. මේ අතර බර්නාඩ් අදාල චෙක්පත අරුණගේ වාසියට පිටසන් කොට පවරන ලදී. අරුණ අදාල චෙක්පත බැංකුව වෙත ඉදිරිපත් කළ විට, බැංකුව ඒ සඳහා ගෙවීම් ප්‍රතික්ෂේප කරන ලදී.

අනිල් සතු වගකීම් මොනවාද යන්න පැහැදිලි කොට අරුණට මේ පිළිබඳව ගත හැකි ක්‍රියාමාර්ග මොනවාදැයි යන්න පිළිබඳව ඔහුට උපදෙස් දෙන්න.

(ලකුණු 07)

(06) (අ) "රක්ෂණීය හිමිකම" වශයෙන් ඔබ අදහස් කරන්නේ කුමක්දැයි සුදුසු පැහැදිලි කිරීම් සහිතව විස්තර කරන්න.

(ලකුණු 04)

(ආ) ටක් සහ ටික් හවුල්කරුවන් වූ අතර හවුල් ව්‍යාපාරයට අවශ්‍ය සීනි මිලදී ගැනීම පිණිස ටික්ව පත්කරන ලදී. ටික්, ටක් වෙත නොදන්වා තමා සතු සීනි තොගයක් වෙළඳපලේ මිලට වඩා වැඩි මිලකට හවුල් ව්‍යාපාරය වෙත සපයා සැලකිය යුතු ලාභයක් ඉපයීය.

හවුල්කරුවන් සතු හෙළිදරව් කිරීමේ යුතුකම කුමක්දැයි පැහැදිලි කොට, මෙම තත්ත්වය සම්බන්ධයෙන් ටික්ගේ වගකීම් කෙසේදැයි දක්වන්න.

(ලකුණු 08)

(ඇ) අධිකරණයේ මැදිහත්වීමකින් තොරව හවුල් ව්‍යාපාරයක් විසුරුවා හැරිය හැකි අවස්ථා මොනවාද?

(ලකුණු 08)

(07) (අ) "කාර්මික ආරවුලක්" යනු කුමක්ද? විනිශ්චිත නඩු තීන්දු ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(ආ) කම්කරු විනිශ්චය සභාවක් සතු බලය සහ යුතුකම් මොනවාදැයි කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 05)

(ඇ) 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනතට අනුව සේවකයන් වෙත පාරිතෝෂික ගෙවීම පිළිබඳව සේවායෝජකයෙකු සතු වගකීමේ ස්වභාවය සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

(08) (අ) රජයේ සේවකයන්ගේ වෘත්තීය සමිති ලියාපදිංචි කිරීම පිළිබඳව බලපාන්නාවූ විශේෂ සීමා කිරීම් මොනවාද?

(ලකුණු 06)

(ආ) වැටුප් ගෙවීම සහ වාර්තා නඩත්තු කිරීම පිළිබඳව 1941 අංක 17 දරන පඩිපාලක සභා ආඥා පනතේ සඳහන් විධිවිධාන මොනවාදැයි විස්තර කරන්න.

(ලකුණු 06)

(ඇ) 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතට අනුව, වයස 50 සම්පූර්ණවීමට පෙර කාන්තාවකටද වයස අවුරුදු 55 සම්පූර්ණ වීමට පෙර පුරුෂයකුටද අරමුදලේ ප්‍රතිලාභ ලබාගත හැකි විශේෂ අවස්ථා මොනවාදැයි සාකච්ඡා කරන්න.

(ලකුණු 08)